**ශීර්ෂය 17 - පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය**

-----------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම්

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.6 ඡේදය ප්‍රකාරව දක්වා ඇති ආකෘතින් හා සටහන් පදනම් කරගෙන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කළ යුතු වුවත් සටහන 05 හි අත්තිකාරම් ලැබීම් ලෙස දක්වා තිබූ රු.1,705,632 ක වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | අත්තිකාරම් ලැබීම් ලෙස දක්වා තිබූ රු.1,705,632 ක වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අදායම් නොවන ලැබීම් යටතේ ඇතුළත් කළ යුතු වීම. | මෙම කාර්යාලය "බී" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ගිණුම් කටයුතු පවත්වාගෙන යන බැවින්, අත්තිකාරම් ගිණුමේ ලැබීම් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත චෙක්පතකින් යැවීමට කටයුතු කරන නිසා එය ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් නොකරන ලදී. |
| (ආ) | 2018 වර්ෂය තුළ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ විකිණීමෙන් ලද එකතුව රු.15,800 ක ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි වෙනත් ලැබීම් යටතේ දක්වා නොතිබුණි. | වෙනත් ලැබීම් ලෙස දක්වා තිබූ වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි වෙනත් ලැබීම් යටතේ ඇතුළත් කළ යුතු වීම. | මෙම කාර්යාලය "බී" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ගිණුම් කටයුතු පවත්වාගෙන යන බැවින්, ලැබීම් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත චෙක්පතකින් යැවීමට කටයුතු කරන නිසා එය ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් නොකරන ලදී. |
| (ඇ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ දැක්වෙන ආකෘති ප්‍රකාරව මූල්‍ය | චක්‍රලේඛයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව විධිමත් පරිදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 267/2018 චක්‍රලේඛයේ 3.1 අනුව |

| | | |
|---|---|---|
| කාර්යසාධන ප්‍රකාශයේ ප්‍රධාන ලෙජර් වියදම දක්වා නොතිබුණි. එසේම පුනරාවර්තන වෙන් කිරීම් වටිනාකම රු.450,000 කින් වැඩියෙන් හා මුළු වියදම රු.1,550,000 ක් අඩුවෙන් දක්වා තිබීම. | | භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශය පරිදි සංඛ්‍යාත්මකව ඇතුළත් කර ඇති අතර අත්තිකාරම් ගිණුමේ ඇස්තමේන්තු මූල්‍ය කාර්යසාධන ප්‍රවාහයට (ඒසීඒ-එෆ්) ඉදිරි වර්ෂයේදී ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු වැඩ තහනම් කළ නිලධාරීයෙකුගේ ආපදා ණය ශේෂය රු.128,800 ක්වූ අතර, එම හිඟහිටි ශේෂය වර්ෂ 03 ගත වී තිබුණත්, අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | ණය මුදලක් ආපසු ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගන්නා වූ හෝ මිය යන්නා වූ හෝ සේවය අවසන් වන්නා වූ හෝ නිලධාරියෙකු සහ රාජ්‍ය සංස්ථාවකට මුදා හරිනු ලබන නිලධාරීයෙකුගේ ණය ශේෂයන් අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වේ. | වැඩ තහනම් කර ඇති නිලධාරියකුගෙන් අය විය යුතු ආපදා ණය මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු නීතිපති තුමා වෙත යොමු කර ඇත. |
| (ආ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වත්කම් වාර්තාව හා මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාව අනුව 2018 ජනවාරි 01 දිනට හා 2018 දෙසැම්බර් 31 දිනට විදුලි උපකරණ ශේෂය රු.91,601 ක් වුවද සිගාස් වැඩසටහන අනුව පිළියෙල කරන ලද වත්කම් ලේඛණය අනුව එම වටිනාකම රු.121,600 ක් වූ බැවින් එම ශේෂ අතර වෙනස රු.29,999 ක් විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වත්කම් වාර්තාව, මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාව හා සිගාස් වැඩසටහන අනුව පිළියෙල කරන ලද වත්කම් ලේඛණය යන ලේඛණ 03 හිම ශේෂයන් සමාන විය යුතු වීම. | 2018 දෙසැම්බර් දක්වාම කාර්යාලය සතු මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාව හා භාණ්ඩාගාරයේ වාර්තා සමානව පැවතුනි. නමුත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීම් අනුව කාර්යාලය සතු වත්කම් සංචලන වාර්තාව සීගාස් වැඩසටහන මගින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත Upload කරන ලදී. එම අවස්ථාවේදීම සිදුවූ තාක්ෂණික දෝෂයක් නිසා රු.29,999 ක වෙනසක් පවතී. දැනටමත් මේ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති අතර, එය |

කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

### 1.6.3 අග්‍රිම ශේෂය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය මඟින් දක්වා තිබූ විදේශ ගමන් වියදම් ආපසු ලැබීම් ගිණුම් ගත කිරීමේදී ඇති වූ වෙනස වන රු.76,810 ක මුදල ගැලපුම් ගිණුමක් මඟින් නිරවුල් කර නොතිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව ලැබීම් හා මුළු වියදම් අතර වෙනසක් ඇති වුවහොත් එම වෙනස ගැලපුම් ගිණුමක් මඟින් නිරවුල් කළ යුතු වීම. | 17-1-1-1102 (ගමන් වියදම් විදේශ) වැය විෂයට බැර කිරීම සඳහා 2018 පෙබරවාරි මස අංක 161106 දරන හා 2018 ජූලි මස අංක 161291 දරන චෙක්පත් මගින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත යවන ලද රු.76,810 මුදල භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල නිවැරදිව ගිණුම්ගතව තිබූ නමුත්, මෙම කාර්යාලයේ සිගාස් වැඩසටහනේ එය නිවැරදි නොවූ නිසා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් මත මෙම කාර්යාලයෙහි 17-1-1-1102 (විදේශ ගමන්) වැය විෂයට අධිභාර (**Surcharge**) කරන ලදී. ඉන් පසුව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් පරීක්ෂා කිරීමේදී ඉහත සටහන දෙවරක් ගිණුම්ගතව තිබූ නිසා මාරු පත්‍රයක් පිළියෙල කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර, එම දෙපාර්තමේන්තුව විසින් නැවත පිළියෙල කළ මාරු පත්‍රය මගින් අදාල ගනුදෙනුව ගිණුම්ගත කර ඇත. මෙහිදී මෙම කාර්යාලයේ වැය ශීර්ෂය නිවැරදි වුවත්, අක්මුදල් ගිණුමට රු.76,810 ක අක්මුදලක් ලැබුණා සේ සටහන්ව ඇත. නමුත් මුදලින් අක්මුදලක් ලැබී නැති බව දන්වා සිටිමි. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 451 ප්‍රකාර ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ලැබෙන චෙක්පත් හා මුදල් ඇණවුම් සටහන් කර ගැනීමට හැකිවන පරිදි ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මුදල් ලැබීම් ලැබෙන මුදල් චෙක්පත් මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනයේ ඇතුළත් කර ඉදිරියේදී යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6 ඡේදය, 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය, 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛය. | නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කල යුතු වුවත් එසේ කිරීමකින් තොරව රු.1,339,883 ක දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කළ යුතුය. | රාජකාරී වේලාවෙන් පසුව රැස්වීම පැවැත්වුවහොත් දීමනා ගෙවනු ලබන්නේ පාර්ලිමේන්තු රැස්වීම් අවසන් වන වේලාව පදනම් කරගෙන බවත්, පස්වරු 06.30 න් පසුව සේවය කර ඇති නිලධාරීන්ට පමණක් මෙම දීමනාව ගෙවා ඇති බවත් දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූලධන වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජන කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18 ක සිට සියයට 99 ක දක්වා පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළයුතු වීම. | කාර්යාලය සතු වාහන ඉතා පැරණි නොවන හෙයින් අළුත්වැඩියා අවශ්‍යතා ඇති නොවූ අතර අයහපත් කාලගුණය හේතුවෙන් පුහුණු වැඩමුළුවපැවැත්වීමට නොහැකි විය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5(1)(ඇ) යටතේ දක්වා ඇති අවස්ථානුගත කරුණු සපුරා ලන්නේ නම් මිස කිසිම රජයේ නියෝජ්‍ය ආයතනයක් ස්වයංක්‍රීය ලෙස සෘජු කොන්ත්‍රාත් ක්‍රමය සඳහා සුදුසුකම් නොලබයි. සෘජු කොන්ත්‍රාත් ක්‍රමය උචිත නොවන විටදී එම ක්‍රමය භාවිතා කර අවස්ථා 2 කදී රජයේ නියෝජ්‍යාතනයකින් රු.92,844 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළයුතු වේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 (අ) අනුව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය සලකා අදාල මිලදී ගැනීම් සිදුකළ අතර, මින් ඉදිරියට ඔබ විසින් දී ඇති උපදෙස් සැලකිල්ලට ගනිමින් අදාල මිලදී ගැනීම් සිදු කරන බව දන්වමි. |